# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 07 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024 திகதி

දිනය
Date — 02/01/2024
පැය 1155

**මාධ්‍ය නිවේදනය**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2024.01.01 වන දින සවස් කාලයේදී මුල්ලේරියාව පොලිස් වසමේ නාවන මාවත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 34** ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මුල්ලේරියාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන මුල්ලේරියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**02. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නුංගමුව පොලිස් ස්ථානය.**

2024.01.01 වන දින සවස් කාලයේදී පල්ලෙවෙල පොලිස් වසමේ මුද්දරගගම ප්‍රදේශයේදී නුංගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 67 ක්, නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1155 ක්, තඹ දඟර 01 ක් සහ ගෑස් සිලින්ඩරයක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන මුද්දරගගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නුංගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**